රිදිගම ප්‍රාදේශීය සභාව
කුරුණෑගල දිස්ත්‍රික්කය
--------------------------------

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 25 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 22 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2014 දෙසැම්බර් 11 දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදී.

1.2 මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට රිදිගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). සභාව වෙත සමාලෝචිත වර්ෂයේදී ජාතික ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතියෙන් පරිත්‍යාග ලෙස ලද රු.2,587,200 ක් වූ ට්‍රැක්ටර් හා ට්‍රේලර් දෙකක වටිනාකම ස්ථාවර වත්කම් යටතේ ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ආ). 2012 වර්ෂයේදී පරිත්‍යාග ලෙස ලද රු.63,000 ක් වටිනා හලර් යන්ත්‍රයක් ස්ථාවර වත්කම් යටතේ ප්‍රාග්ධනිත කර නොතිබුණි. ඉකුත් වර්ෂ වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී ලද රු.2,766,548 ක වැටුප් ප්‍රතිපූර්ණ ලැබීම් වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම් ගතකර තිබුණි.

(ඇ). සමාලෝචිත වර්ෂයට අදාල රු.195,760 ක් වූ මුද්දර ගාස්තු වියදම රු.139,685 ක් ලෙස එනම් රු.56,075 ක් අඩුවෙන්ද සමාලෝචිත වර්ෂ අවසානයට ගෙවිය යුතු වූ රු.63,049 ක මුද්දර ගාස්තු ශේෂය රු.78,498 ක් ලෙස එනම් රු.15,499 ක් වැඩියෙන් ද මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.

(ඈ). සමාලෝචිත වර්ෂයේ විශ්‍රාම පාරිතෝෂික ගෙවීම සඳහා ලද රු.601,399 ක් ගෙවිය යුතු විශ්‍රාම පාරිතෝෂික ගිණුමට බැර කිරීම වෙනුවට විවිධ තැන්පතු ගිණුමට බැරකර තිබුණි.

1.3.2 අසම්භාව්‍ය බැරකම්

ප්‍රාදේශීය සභාවේ සේවය කර විශ්‍රාම ලබා ඇති පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතු සේවකයන්ට අදාලව සභාව විසින් එම අරමුදලට ගෙවිය යුතු දායක මුදල් නිසි පරිදි නොගෙවීම නිසා සමාලෝචිත වර්ෂය අවසානය වන විට එම අරමුදලට ගෙවිය යුතු ශේෂය රු.3,023,892 ක්ව තිබුණි.

1.3.3 නොසැසඳූ පාලන ගිණුම්

සමාලෝචිත වර්ෂයට අදාල බිල් කිරීම්,ලැබීම්, අවසාන ශේෂය හා තැන්පත් යටතේ ගිණුම් විෂයයන් 14 කට අදාලව ගිණුම අනුව සහ අදාල ලේඛන අනුව අනුරූපී අගයන් අතර රු. 2,626,418 ක නොසැසඳීම් පැවතුණි.

1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ). 2013 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.94,025,683 ක් වූ අතර, ඒයින් රු. 35,395,490 ක් වර්ෂ 3කට වඩා පැරණි ශේෂයන් විය.

(ආ). 2013 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතුව තිබූ ගිණුම් ශේෂවල වටිනාකම රු.50,715,412 ක් වූ අතර, ඒයින් රු. 13,413,044 ක් වසර 1කට වඩා පැරණි ශේෂයන් විය.

1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීම නිසා එකතුව රු. 38,009,708 ක ගනුදෙනු පිළිබඳව විස්තරාත්මක පරීක්ෂාවක් කළ නොහැකි විය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.7,711,199 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.2,106,177 ක් වීමෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.5,605,022 ක වර්ධනයක් පැවතුණි. මෙකී මූල්‍ය ප්‍රතිඵලයට රු.37,339,567 ක් වූ ප්‍රාග්ධන ආධාර හා රු.39,448,588 ක් වූ ප්‍රාග්ධන වැය ගැලපූ විට සමාලෝචිත වර්ෂයට අදාල අතිරික්තය රු.5,602,178 ක් දක්වා අඩුවී තිබුණි.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ). සමාලෝචිත වර්ෂයට අදාලව සභාවේ මුළු පුනරාවර්තන ආදායම වූ රු.44,917,508 න් සියයට 86 ක් ලෙස රු.38,610,408 ක් පමණ උත්පාදිත ආදායම් නොවන උසාවි දඩ, මුද්දර ගාස්තු හා වැටුප් ප්‍රතිපූර්ණ වැනි දීමනා ස්වරූපයේ ලැබීම් වලින් සමන්විත විය. එමෙන්ම ප්‍රාග්ධන ආදායම වූ රු.37,339,567 ක මුළු ප්‍රමාණයම ගමනැගුම, මගනැගුම වැනි ප්‍රභවයන් මත වෙනත් ආයතන මගින් බල ප්‍රදේශයේ සංවර්ධන කාර්යයන් සඳහා ලද මුදල් වලින් සමන්විත විය.

(ආ). සමාලෝචිත වර්ෂයට අදාල මුළු පුනරාවර්තන වියදම වූ රු.37,206,308 න් සියයට 68 ක් ලෙස රු.25,363,809 ක් පමණ පෞද්ගලික පඩිනඩි වියදම වූ අතර ඉන් සියයට 91 ක් ලෙස රු.22,992,172 ක් පමණ වැටුප් ප්‍රතිපූර්ණ ලෙස පළාත් පාලන කොමසාරිස් වෙතින් ලැබී වෙනත් ආදායම් යටතේ ගිණුම් ගතකර තිබුණි. එමෙන්ම ප්‍රාග්ධන වියදම වූ රු.39,448,588 න් සියයට 9 ක් ලෙස රු.3,416,884 පමණක් සභා අරමුදලින් වැයකර තිබූ අතර, ඉතිරි සියයට 91 වූ රු.36,031,704 ක් පමණ ප්‍රමාණය මගනැගුම, ගමනැගුම වැනි ප්‍රභව මත වෙනත් ආයතන ප්‍රතිපාදන වලින් ඉටුකල සංවර්ධන කාර්යයන්ගෙන් සමන්විත විය.

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

වෙළඳ බලපත්‍ර, ව්‍යාපාර බදු, කඩකුලී, බදුකුලී වැනි ආදායම්, ක්ෂේත්‍රයේදී එකතු කිරීම සඳහා නිශ්චිත බලයක් නොතිබුණද, සභාවේ ආදායම් එකතු කරන්නන් විසින් වර්ෂය පුරාම වරිපනම් බදු හා වෙළඳ බලපත්‍ර වැනි ආදායම්ද ක්ෂේත්‍රයේදී එකතු කර තිබුණි.

2.3.2 වරිපනම් බදු

සමාලෝචිත වර්ෂය අවසානයට වරිපනම් බදු හිඟය රු.2,598,160 ක් වූ අතර වාර්ෂික බිල්කිරීම් රු.1,819,977 ක් විය. 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 32-42 දක්වා වූ රීතින් ප්‍රකාරව කාර්තු පදනම් කරගෙන හිඟ ලැයිස්තු සකස් කර, අදාල නිවේදන නිකුත් කිරීමෙන් පසු දේපල තහනමට ගෙන හිඟ වරිපනම් අයකිරීමේ ක්‍රියාවලිය දූර්වල මට්ටමක පැවතුණි.

2.3.3 බදු කුලී

අවම ලංසුව රු.450,000 ක් වූ තල්ගස්පිටිය එළහරක් මස් කඩයේ වෙළඳ අයිතිය බදු ගැනීමට 2011 වර්ෂයේ සිටම ටෙන්ඩර්කරුවන් ඉදිරිපත්ව නොතිබුණි. එමෙන්ම 2011 හා 2012 වර්ෂවලදී සභාව විසින් බදුදී තිබූ වත්කම් 04 කට අදාලව රු.242,710 ක හිඟ මුදලක් අයවිය යුතුව තිබුණි.

2.3.4 ව්‍යාපාර බදු හා වෙළඳ බලපත්‍ර ගාස්තු

වර්ෂ 10 ක පමණ කාලයක සිට පැවත එන වෙළඳ බලපත්‍ර හිඟය දොඩම්ගස්ලන්ද උපකාර්යාලයට අදාලව රු.63,979 ක්ද, ප්‍රධාන කාර්යාලයට අදාලව රු.478,485 ක්ද විය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

සභාව විසින් 2008-2011 කාලය තුල අනුමත කල ගොඩනැගිලි අයදුම්පත් 264 න් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් අනුකූලතා සහතික ලබා නොගත් ස්ථාන 244 ක් විය. එම ගොඩනැගිලි සියල්ල ඉදිකර තිබුනේ නම් සහා අතුරු ව්‍යවස්ථා අනුව රු.48,800 ක අනුකූලතා සහතික ආදායමක් උපයාගත හැකිව තිබුණි. ගොඩනැගිලි ඉදිකර අවසන්ව නොමැති නම් බලපත්‍ර කාලය දීර්ඝ කරවා ගැනීම් ගාස්තු අයකිරීමට අදාල විධිවිධාන සභාව ඇතිකර ගෙන නොතිබුණි.

3.2 අවිධිමත් ගනුදෙනු

පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයෙන් ලද රු.800,000 ප්‍රතිපාදන යටතේ සභාව විසින් පෙර පාසල් උපකරණ මිලදී ගැනීමේදී අවම මිල ගණන් ඉදිරිපත් කර තිබූ හා වසර දෙකක වගකීම් කාලයක් ලබාදී තිබූ ආයතනයේ මිල ගණන් ප්‍රතික්ෂේප කර, වැඩි මිලක් හා වසරක වගකීම් කාලයක් ලබාදී තිබූ ආයතනයේ භාණ්ඩ ගුණාත්මක බවින් යුතු බව හා ඉතා කඩිනමින් සපයා දියහැකි බව සඳහන් කර එම ආයතනයෙන් භාණ්ඩ මිලදී ගැනීමට සභාව නිර්දේශ කර තිබුණි. මේ හේතුවෙන් සභාවට රු.197,600 ක් අවම මිලට වඩා ගෙවීමට සිදුව තිබුණි.

3.3 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

2011 වර්ෂයේදී පිළිසරු ව්‍යාපෘතිය යටතේ කාබනික පොහොර ලබාගෙන පැළ නිෂ්පාදනය කර අලෙවි කිරීම අරමුණු කර, පැල තවානක් හා අලෙවි සැලක් ආරම්භ කිරීම වෙනුවෙන් රු.332,284 ක් වැයකර තිබුණද, පිළිසරු ව්‍යාපෘතිය යටතේ කාබනික පොහොර නිෂ්පාදනයක් සිදුව නොතිබීම හේතුවෙන් පැල තවානද ආරම්භ කර නොතිබුණි.

4. <u>ගිණුම් කටයුතු භාවය හා යහපාලනය</u>

4.1 <u>අයවැය පාලනය</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ). සමාලෝචිත වර්ෂයට අදාලව වැටුප් හා දීමනා වලට අදාලව රු.2,987,809 ක් හා ප්‍රාග්ධන වියදම් වලට අදාලව රු.31,708,438 ක ඉක්මවීම් පැවතුණි.

(ආ). සමාලෝචිත වර්ෂයට අදාලව ආදායම් යටතේ ඇස්තමේන්තුගත ආදායම රු.5,156,790 ක් වූ අතර, අයකරගෙන තිබූ ආදායම රු.3,109,599 ක් විය.

(ඇ) සභාව විසින් සමාලෝචිත වර්ෂය තුල ඉටුකිරීමට සැලසුම් කර තිබූ රු.2,549,990 ක් වටිනා ප්‍රාග්ධන කාර්යයන් 03 ක් හා රු.1,344,000 ක් වටිනා සුභ සාධන කාර්යයන් 15 ක් ඉටුකර නොතිබුණි.

5. <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ). ගිණුම්කරණය

(ආ). අයවැය පාලනය

(ඇ). මූල්‍ය පාලනය

(ඈ). ආදායම් පරිපාලනය

(ඉ). වත්කම් කළමනාකරණය